රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
அரச சேவைகள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Services, Provincial Councils and Local Government**

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | **COMBINED SERVICES DIVISION**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන / தொலைபேசி: **(94) 011- 2694560** / Telephone
ෆැක්ස් / தொலைநகல்: **(94) 011- 2692254** / Fax
ඊ-මේල් / மின்னஞ்சல்: **dgcs@pubad.gov.lk** / E-mail
වෙබ් අඩවිය / இணையத்தளம்: **www.pubad.gov.lk** / Web Site


---

මගේ අංකය / எனது இல / My No: CS/DOS/Policy/03/05(II)

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2021.12.16

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කරන ලද නිලධාරීන්ගේ ආයතනික කටයුතු සම්බන්ධවයි</u>**

අංක 1774/31 දරණ 2012.09.07 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් සංශෝධිත අංක 1745/11 හා 2012 පෙබරවාරි මස 14 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් පළ කළ සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය වීම සඳහා මනාපය පළ කරන ලද නිලධාරීන්ගේ අන්තර්ග්‍රහණ කටයුතු මේ වන විට අවසන්වෙමින් පවතින අතර එම නිලධාරින්ගේ තනතුරු නාමය,මනාපය ඉල්ලා අස්කර ගැනීම් වැනි කරුණු සම්බන්ධයෙන් නිරන්තරයෙන් විමසීම් කරනු ලබයි.

**<u>02 . අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධාරීන්ගේ තනතුරු නාමය</u>**

i) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2012 හි 2 ඡේදය අනුව සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණයට මනාපය පළ කරන ලද නිලධාරීන් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කළ පසුවද ඔවුන් දරමින් සිටි තනතුරු නාමය නොවෙනස්ව පවතියි.එහෙත් එකී තනතුරු අනුමත කාර්යමණ්ඩලය තුළ සංවර්ධන නිලධාරී සේවයට අයත් තනතුරු ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය.

උදා. ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයට අනුයුක්ත සංවර්ධන සම්බන්ධීකාරක නිලධරයෙකු සංවර්ධන නිලධාරි සේවාවට අනුයුක්ත වීම මත සිය තනතුරු නාමය වෙනස් නොවේ. මෙහිදී නිලධාරියාගේ/නිලධාරිණියගේ තනතුර හා සේවාව පහත පරිදි දැක්විය යුතුය.
තනතුර : සංවර්ධන සම්බන්ධීකාරක
සේවාව : සංවර්ධන නිලධාරී සේවාව

ii) සංවර්ධන නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කල නිලධාරියෙකු වෙනත් සේවා ස්ථානයකට ස්ථාන මාරුවීම් ලැබූ අවස්ථාවකදී එම සේවා ස්ථානයේ පවතින තනතුරු අනුව තනතුරු නාමය සංශෝධනය වනු ඇත.
උදා. ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයට අනුයුක්ත සංවර්ධන නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කල සංවර්ධන සම්බන්ධීකාරක නිලධරයෙකු පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි තනතුරක් සඳහා ස්ථානමාරු වූ අවස්ථාවක එම නිලධරයා තනතුර හා සේවාව පහත පරිදි දැක්විය යුතුය.
තනතුර : ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි
සේවාව : සංවර්ධන නිලධාරී සේවාව

**03.** **<u>සංවර්ධන නිලධාරී සේවාවට අන්තර්ග්‍රහණයට මනාපය පළ කරනු ලබන නිලධාරීන්හට එම මනාපය පසුව ඉල්ලා අස්කර ගැනීමේ හැකියාවක් නොමැති බව</u>**

2017.05.23 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළැඹි අංක අමප/17/0759/734/015 හා 2017.05.31 දිනැතිව දන්වන ලද අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සංවර්ධන නිලධාරී සේවාවට අන්තර්ග්‍රහණයට මනාපය පළ කරනු ලබන නිලධාරීන්හට එම මනාපය පසුව ඉල්ලා අස්කර ගැනීමේ හැකියාවක් නොමැති බැවින් එවැනි ඉල්ලීම් සම්බන්ධව කටයුතු කිරීමේ හැකියාවක් නොමැත.

**04.** **<u>අන්තර්ග්‍රහණය වීමට අදාළ ලේඛන නිසිපරිදි ඉදිරිපත් නොකිරීම මත සේවයෙන් උසස්වීම්/විශ්‍රාම ගැන්වීම ඇතුළු ආයතන කටයුතු සිදුකිරීමට නොහැකි වී ඇති බව</u>**

සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය වීම සඳහා මනාපය පළ කරන ලද නිලධාරීන් අතුරින් විශාල ප්‍රමාණයක් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කර තිබුනද තවත් සැලකිය යුතු ප්‍රමාණයකගේ අන්තර්ග්‍රහණයට අවශ්‍ය ලේඛන ඒකාබද්ධ සේවා අංශයට යොමු නොකිරීම මත ඔවුන්ගේ අන්තර්ග්‍රහණ කටයුතු සම්බන්ධ ඉදිරි කටයුතු සිදුකිරීමට නොහැකි වී ඇත.
සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය වීම සඳහා මනාපය පළ කරන ලද නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සම්බන්ධ කටයුතු, ශ්‍රේණිගත උසස් කිරීම්, සේවයෙන් විශ්‍රාම ගැන්වීම ආදී සියළු ආයතන කටයුතු ඒකාබද්ධ සේවා අංශය වෙතින් සිදුවිය යුතු අතර අන්තර්ග්‍රහණයට අවශ්‍ය ලේඛන නිසිපරිදි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඉහත ආයතන කටයුතු නිසිපරිදි සිදු නොවීම මත මෙම නිලධාරීන් අපහසුතාවට පත්වී ඇත. **විශේෂයෙන්ම මෙවැනි නිලධාරීන් නියමිත දිනට විශ්‍රාම ගැන්වීමට නොහැකි විමෙන් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් සකස් කිරීමේ කටයුතු ද ප්‍රමාද වී ඇත.**

තවද, සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කර ඇති නමුත් මේ වනවිට වෙනත් තනතුරු සඳහා මුදාහැර ඇති නිලධාරීන්ගේ අන්තර්ග්‍රහණයට අවශ්‍ය ලේඛන නිසිපරිදි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් උසස්වීම් ලිපි හා විධිමත් මුදාහැරීමේ ලිපි නිකුත් කිරීම ප්‍රමාද වී ඇති අතර එම නිලධාරීන්ගේ නව තනතුරට අදාල වැටුප් සකස් කිරීමේදී ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදය ප්‍රකාරව නියමිත වැටුප් පියවරේ තැබීමද සිදු නොවන බව නිරීක්ෂණය වී ඇත.

05. එබැවින් ඔබ ආයතනවල සේවය කරන සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය වීම සඳහා මනාපය පළ කරන ලද නිලධාරීන් ආයතන කටයුතු ඉහත දක්වා ඇති උපදෙස් අනුව සිදුකරන ලෙසද, අන්තර්ග්‍රහණයට මනාපය කල අදාළ ලේඛන තවමත් යොමුකර නොමැති නිලධාරීන් මේ පිළිබඳ දැනුවත් කර අන්තර්ග්‍රහණයට අදාළ ලේඛන කඩිනමින් මා වෙත යොමු කරන මෙන් ඉතා කාරුණිකව ඔබ වෙත දන්වමි.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්